ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන

5වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU5557- ප්‍රාථමික පාසල් ගුරුවරුන් සඳහා පළමු භාෂාව -සිංහල**

කාලය - පැය තුනයි. (03)

දිනය - 2025.06.15 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ ඇති සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

## 1 - වන කොටස

01. භාෂාවේ සන්නිවේදන මූලික කාර්යය කරුණු තුනක් (03) යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න.

02. "මානව සංස්කෘතික ප්‍රවාහයේ දී භාෂාව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි" මේ පිළිබඳ ඔබේ අදහස් තර්කානුකූලව ඉදිරිපත් කරන්න.

03. භාෂාවේ ආත්මීය කාර්යයේ අග්‍රඵලයක් ලෙස "චින්තනය" හඳුන්වාදිය හැකිය. කරුණු ඉදිරිපත් කරමින් මෙම අදහස සාධාරණීකරණය කරන්න.

04. "සමාජය තුළ පවත්නා විවිධත්වය භාෂාව තුළින් පිළිබිඹු වේ." උදාහරණ තුනක් (03) සමඟින් මෙම අදහස තහවුරු කරන්න.

05. "සන්නිවේදනයෙහි ලා භාෂාව සතු ගුණාංග කිහිපයක් වෙයි." භාෂාවේ "ශබ්ද-අර්ථ දෙකේ ඇති අපූර්ව සංවිධානාත්මකභාවය" යන්න පැහැදිලි කරන්න.

06. සිංහල අක්ෂර මාලාව (හෝඩිය) වර්තමානය දක්වා විකාශනය වූ අවස්ථා පහ (05) නම් කරන්න.

07. අමිශ්‍ර සිංහල හෝඩියේ ගාත්‍රාක්ෂර ලියා දක්වන්න.

08. සන්ධි විධි නම් කර එම විධි උදාහරණයක් බැගින් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

ලකුණු 05 X 08 =40

## II - කොටස

09. I. අක්ෂර වින්‍යාස රීති හතරක් (04) ලියා දක්වන්න. එම රීති හතර (04) උදාහරණයක් බැගින් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු තුළ අක්ෂර වින්‍යාස රීති පිළිබඳ ව මනා අවබෝධයක් පැවතීමේ අවශ්‍යතාව උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. I. "උක්ත - ආඛ්‍යාත පද සම්බන්ධ වාක්‍ය රීති පිළිබඳ ව නිවැරදි අවබෝධය ගුරුවරයෙකුට ඉතා වැදගත් වේ." උක්ත ආඛ්‍යාත පද සම්බන්ධ වාක්‍ය රීති පහක් (05) උදාහරණයක් බැගින් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 )

II. භාෂාව භාවිතයේදී උක්ත- ආඛ්‍යාත පද සම්බන්ධ වාක්‍ය රීති පිළිබඳ ව පවතින දැනුමවත් භාවය ශිෂ්‍යයෙකුට ප්‍රායෝජනවත් වන ආකාරය ඔබේ අත්දැකීම් භාවිත කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 )

11. I. ප්‍රාථමික පාසල් සිසුන් පෙන්නුම් කරනු ලබන කියවීමේ දුෂ්කරතා පහක් (05) උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 )

II. ඉහත සඳහන් කළ දෝෂ තුනක් (03) අවම කිරීම සඳහා ගුරුවරයෙකු වශයෙන් ගත යුතු ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 10 )

12. I. ළමා සාහිත්‍යය යන්න අර්ථ දක්වා ළමා සාහිත්‍යාංග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 )

II. ගුරුවයෙකු වශයෙන් ඔබ, ළමා කතන්දර ඇසුරු කරගෙන ශිෂ්‍යයන්ගේ චිත්තවේග සංවර්ධනය කරන ආකාරය අන් අයට පැහැදිලි කිරීමට ලිපියක් ලියන්න. (ලකුණු 10)

13. I. "ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිට ම නිර්මාණාත්මක ලේඛනය පිළිබඳ ව ශිෂ්‍යයින් තුළ අත්දැකීම් ප්‍රගුණ කළ යුතු ය." කරුණු ඉදිරිපත් කරමින් ඉහත සඳහන් අදහස සාධාරණීකරණය කරන්න. (ලකුණු 10 )

II. ඔබ දන්නා ළමා නාට්‍යයක් පිළිබඳ ව විවේචනාත්මක විශ්ලේෂණයක් කරන්න. (ලකුණු 10)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*